Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

# නර්තනය

**8 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **සියළුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 සතර බීජාක්ෂර පිළිබඳ අවබෝධය ලබාගන්නේ,

(i) බෙර සරඹ වාදනයෙනි. (ii) අංගුලියා බෙරපද වාදනයෙනි.

(iii) අත්‍යාබෙර වාදනයෙනි. (iv) මගුල් බෙර වාදනයෙනි.

02 'සිරස පාද කවි ගායනා කරන ශාන්ති කර්මයකි.

(i) බලි ශාන්ති කර්මය (ii) කෙහොඹා කංකාරිය

(iii) සූනියම් ශාන්ති කර්මය (iv) දෙවොල්මඩු ශාන්ති කර්මය

03 ශරීරයේ විවිධ අංගවලට තලමින් නර්තනය කරනු ලබන ගැමි නැටුමකි.

(i) සවරං (ii) පතුරු

(iii) චාමර (iv) ලී කෙළි

04 අගය වඩන කවි වරුණා.... මෙම කවි පදය අයත් තාල රූපය වන්නේ,

(i) මාත්‍රා 2 + 3 තාල රූපයයි. (ii) මාත්‍රා 2 තාල රූපයයි.

(iii) මාත්‍රා 3 තාල රූපයයි. (iv) මාත්‍රා 4 තාල රූපයයි.

05 රුදගත ගත ගත කුකුදත් ..... ගජිත්ත ගත් ජිත් කුංදත් ..... මෙය,

(i) කස්තිරමකි. (ii) සීරුමාරුවකි.

(iii) අඩව්වකි. (iv) අලංකාර පදයකි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **ප්‍රශ්න අංක 06 - 10 දක්වා ඇති ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.**

( අම්බැක්කේ, දුර්සාදේවිය, කිතුල්, සූර්යදෙවි, කෙසෙල් )

06 නවරාත්‍රී උත්සවයේදී පළමු දින තුනේ දී ........................................................................................ දේවිය වෙනුවෙන් පූජා පැවැත්වීම කරනු ලබයි.

07 ........................................................................ පහතරට බෙරය සකස් කර ගැනීමට ගනු ලබන අමුද්‍රව්‍යයකි.

08 බාල්කයක කැටයම් කර ඇති ලී කෙළි නැටුම ............................................................................ දේවාලයේ දැකිය හැකිය.

09 සවරං නැටුම් හා බැදි ගායනා වලදී ............................................................................ පිළිබඳව සඳහන් වේ.

10 ගොප්ගෙඩියක් නිර්මාණය කිරීමට ................................................................. ගසේ අමුද්‍රව්‍ය භාවිතා කරයි.

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නොගැලපෙන වචනය තෝරන්න.**

| | | | | |
|---|---|---|---|---|
| 11 | කස්තිරම | සිරුමානම | අඩව්ව | තානම |
| 12 | දුර්ගා | පත්තිනි | ලක්ෂ්මී | සරස්වතී |
| 13 | අලියා | අශ්වයා | සිංහයා | දඩයක්කාරයා |
| 14 | වෙසක් | නවරාත්‍රී | රාමසාන් | අවුරුදු |
| 15 | පතුර | සවරම | කුල්ල | වංගෙඩිය |

- **අංක 16 සිට 20 දක්වා වූ ප්‍රශ්න සඳහා පහත සඳහන් ප්‍රහේලිකාව ඇසුරු කර ගනිමින් පිළිතුරු සපයන්න.**

<u>පහළට</u>

16 ගැටබෙරය අයත් නර්තන සම්ප්‍රදායයි.


17 නර්තන විෂයේදී පුදපූජා ලබන දේවතාවියකි.

18 නව රාත්‍රී උත්සවයේ භාවිතාවන ගායන විශේෂයකි.

<u>හරහට</u>

19 ගොප්ගෙඩි, මංගලපෝරු ආදී වේදිකා සැරසිලි යොදා ගන්නේ මෙවන් අවස්ථාවලදීය.

20 ශාන්තිකර්ම වලින් බැහැර වූ සම්ප්‍රදායික නර්තන විශේෂයකි.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 ශාන්තිකර්ම රඟමඩල විචිත්‍රවත් කරන දේශීය කැටයම් කලාව සංස්කෘතික අනන්‍යතාව විදහා දක්වයි.

(i) සරල සැරසලි අංග 02 ක් නම් කරන්න.

(ii) එම සැරසිලි අංග නිර්මාණය කිරීමට භාවිතා කරන අමුද්‍රව්‍යය හා උපකරණ 04 ක් නම් කරන්න.

(iii) එම සැරසිලි අංග භාවිතයට ගන්නා අවස්ථා 02 ක් නම් කරන්න.

02 ගායනයට, වාදනයට මෙන්ම නර්තනයට ද තාලය අත්‍යවශ්‍යය වේ.

(i) 'දොං ජිංත ගත දොංත' බෙර පදය නියමිත තාල රූපයට ප්‍රස්ථාර කරන්න.

(ii) වෛරොඩි වන්නමේ කස්තිරම නියමිත තාල රූපයට ප්‍රස්ථාර කරන්න.

(iii) 'සූරිය කුළ ඇති හිරු දෙවියන්නේ

පැවිය අණසක ලොව පවතින්නේ"

ඉහත සඳහන් කවිපද නියමිත තාල රූපයට ප්‍රස්ථාරගත කරන්න.

03 දේශීය නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු බොහොමයක් 'රූකම්' ආශ්‍රිතව සොයාගත හැක.

(i) රූකම් යන්න හඳුන්වා එහි ප්‍රභේද වෙන්කොට දක්වන්න.

(ii) ආගමික අවස්ථා සඳහා නර්තනය යොදාගත් බව රූකමක් ඇසුරින් පැහැදිලි කරන්න.

(iii) භාරතීය නර්තනය පැවැති බවට එක් රූකමක් මගින් විස්තර කරන්න.

04 නවරාත්‍රී උත්සවය වූ කලි, දෙවියන් මුල්කොට පවත්වනු ලබන ද්‍රවිඩ ජනයාගේ උසස් ආගමික උත්සවයකි.

(i) නව රාත්‍රී උත්සවය පැවැත්වීමේ හේතු දෙකක් ලියන්න.

(ii) එම උත්සවයේ චාරිත්‍ර විධි දෙකක් විස්තර කරන්න.

(iii) එහි භාවිත සැරසිලි අවස්ථා 02 නම් කර ඒවා විස්තර කරන්න.

05 පහත සඳහන් මාතෘකා වලින් 02 ක් තෝරාගෙන කෙටි සටහනක් ලියන්න.

(i) පහතරට බෙරය

(ii) සතර බීජාක්ෂර

(iii) ජන ගී

(iv) නම්‍යතා අභ්‍යාස

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | ii | 06 | දුර්සා දේවිය | 11 | තානම | 16 | උත්සව |
| 02 | i | 07 | කිතුල් | 12 | පත්තිනි | 17 | සරස්වතී |
| 03 | ii | 08 | ඇබ්බැක්කේ | 13 | දඬයක්කාරයා | 18 | තේවාරම් |
| 04 | iii | 09 | සූරියදෙවි | 14 | අවුරුදු | 19 | උඩරට |
| 05 | i | 10 | කෙසෙල් | 15 | වංගෙඩිය | 20 | වන්නම් |

## II කොටස

01 (i) ගොප් ගෙඩිය ගොප් කොළ පියුම ගොප් කොළ කුරුල්ලා ල. 02

(ii) කෙසෙල් කොටයක්, ගොප් කොළ, ඉරටු, මුවහත් පිහියක් ල. 04

(iii) උත්සව අවස්ථාවන් වල වේදිකා අලංකරණය සඳහා පිරිත් මණ්ඩප අලංකාර කිරීම සඳහා
මංගල පෝරු අලංකරණය සඳහා ල. 04

මුළු ලකුණු 10

02 (i)

| ^ 1 | 2 | / 1 | 2 | 3 | ^ 1 | 2 | / 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|
| දොං | - | ජිං | - | ත | ග | ත | දොං | - | ත |

(ii)

| / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රැද | ගත | ගත | ගත | කුකු | දත් | ගජිං | ත | ගත් | ජිත් | කුත් | දත් |
| කකු | දැග | ජිං | තකු | දග | ජිං | තකු | තික | කරි | කිට | කුඳ | කුඳ |
| ගජිං | ත | ගත් | ජිත් | කුන් | දත් | තකු | කක | කරි | කිට | කුත් | දත් |
| තා | | | | | | | | | | | |

(iii)

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | සු | රි | ය | කු | ල | ඇ | ති | හි | රු | දෙ | වි | ය | න් | නේ | - |
| + | පැ | වි | ය | අ | ණ | ස | ක | ලො | ව | ප | ව | ති | න් | නේ | - |

මුළු ලකුණු 10

03 (i) රූප ඇසුරු කර ගනිමින් කරන ලද විචිත්‍රවත් කර්මාන්ත හෙවත් රූපයෙන් කල කලාව 'රූකම්' ලෙස හැඳින්වේ. (ගල් කැටයම්, දැව කැටයම්, ලෝහ කැටයම්, සිතුවම්, මූර්ති) ල. 02

(ii) අනුරාධපුරයේ ලෝවාමහාපායේ ගල්ටැම් පේකඩෙහි ඇති බෙර වයන, කළගෙඩි කෙළියෙහි යෙදෙන, උඩැක්කි වයන හා තාලම්පට වයන නළු රූප වලින් පැහැදිලි වන්නේ ආගමික කටයුතු සඳහා නර්තන හා වාදන අංග යොදාගෙන ඇති ආකාරයයි. මෙයින් පෙනෙන්නේ ආගමික වතාවත් වලට නර්තනය සම්බන්ධ කරගෙන ඇති ආකාරයයි.

ආගමික කටයුතු පිළිබඳව කියවෙන ඕනෑම රූකමක ලකුණු ලබා දෙන්න. ල. 04

(iii) ගම්පොළ යුගයට අයත් ඇම්බැක්කේ දේවාලයේ සිවිරුස් පනේලයේ නෙළා ඇති නිළි රූකම මණ්ඩියක හැඩතලයක් නිරූපණය කරයි. එම මණ්ඩි හැඩතලය භාරතීය මූලික අංගහාරය වන අරමණ්ඩියට සමාන ය. එම සාධකය ඇසුරින් නිගමනය කළ හැක්කේ ඒකල භාරතීය නර්තනය පැවති බවයි. ල. 04

මුළු ලකුණු 10

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

04 (i) දෙවියන්ට පිං දීම, අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම හා ඒවා දියුණු කර ගැනීම, සශ්‍රීකත්වය හා සෞභාග්‍යය ප්‍රාර්ථනා කිරීම. (කරුණු දෙකකට) ල. 02

(ii) පළමු දින දුර්සාදේවියට පූජා පවත්වනු ලබයි. ශක්තිය හා බලය පිළිබඳ පිහිට අපේක්ෂා කරන බව.

දෙවන දින 03 ලක්ෂ්මී දේවිය පූජා ලබන බව, ලක්ෂ්මී දේවියගෙන් ධනය හා සමෘධිය අපේක්ෂා කරන බව.

මේ ආදී ලෙස 02 ක් ලියා ඇත්නම් ල. 04

(iii) සැරසිලි සකස් කරන අවස්ථා දෙකකි.

කෝවිල්වල නිවෙස්වල

කෙසෙල් ගස් හා කෙසෙල් කැන් භාවිතා කරමින් කෝවිල් සරසාගනී. එයින් සශ්‍රීකත්වය අපේක්ෂා කෙරේ.

නිවස අලංකාර කරන ප්‍රධාන සැරසිල්ල 'කොලු' නමින් හැඳින්වේ.

තට්ටු හතකින් යුත් ආසනයක් සකස් කර ඒ මත දේව රූප සෙල්ලම් බඩු තැන්පත් කරන අතර දේව භක්තිය, සමෘධිය හා සෞභාගයය එයින් අපේක්ෂා කරයි. (කරුණු 2 ක් විස්තර කිරීමට) ල. 04

මුළු ලකුණු 10

05 පහතරට බෙරය

පහතරට නැටුමේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය වේ.

අරටු සහිත ශක්තිමත් දැව එනම්, පොල්, කිතුල්, ඇහැල, කොහොඹ, කොස් යොදා ගන්නා බව.

මෙහි දිග තුන් වියත් තුනගුලකි.

හැක්ම, වෙනිවර, වරපටි සඳහා සන හරක් හම් යොදා ගනී. බෙර ඇස් සඳහා හරක් බොකු (සිවිය) යොදා ගනී.

ජන ගී

ජනයා විසින් නිර්මාණය කරන ගීත විශේෂයකි. සාම්ප්‍රදායික ආවේණික නාද මාලා ඇත. විවිධ තිත් රූප වලට අනුව ප්‍රබන්ධ කර ඇත.

මෙහි ගායනය මුඛ්‍ය පරමාර්ථය බව, රබන්, සවරන්, පතුරු, සිරසපාද, වත්නම් ආදී ලෙස විවිධ ගායනා වර්ග පවතිනබව

සකර බීජාක්ෂර

මූලික බෙර ධ්වනි සතර ඒ නම් තත්, ජිත්, තොන්, නං යනුවෙන් හඳුන්වන බව.

උඩරට සබරගමු පහතරට යන ත්‍රිවිධ සම්ප්‍රදායටම පොදු බව.

පහතරට සම්ප්‍රදායේ ජිත් වෙනුවට දිත් කියා යොදන බව, වාදනයේදී අක්ෂර උපදවීම එක් එක් වාද්‍ය භාණ්ඩය අනුව වෙනස් වන බව.

නම්‍යතා අභ්‍යාස

නිවැරදි අංගහාර ඇති කර ගැනීමට නම්‍යතා අභ්‍යාස ප්‍රගුණ කළයුතු බව නම්‍යතා අභ්‍යාස කිරීමෙන් සිරුරේ කඳ නිවැරදිව හැසිරවිය හැකි බව, ශාරීරික සමබරතාව හා ඉවසීම පවත්වා ගැනීමට පහසු බව.

සතුටින් නම්‍යතා අභ්‍යාස කිරීමෙන් මානසික සුවතාව ලබාදෙන බව.

මාතෘකාවක කරුණු 5 කට - ල. 05

මුළු ලකුණු 10